| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2022.11.09 |

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන්

**<u>ගර්භණී සහ කිරිදෙන මව්වරුන් සඳහා මාසිකව රු. 2500/-ක අතිරේක ආහාර සහනාධාර මුදල සමෘද්ධි බැංකුව මගින් ලබා දීමේ වැඩසටහන</u>**
**<u>ඉතුරුම් ගිණුම් විවෘත කිරීම</u>**

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශ ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් අමතන ලද 2022.10.17 දිනැති MWCA/06/10/1-4/23 දරණ ලිපිය මගින්, ගර්භණී සහ කිරිදෙන මව්වරුන්ට මාසිකව රු. 2500/- බැගින්, සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මාස 04ක් සඳහා අතිරේක දීමනාවක් ලබා දෙන බව සඳහන් කර ඇත.

තවද, එම දීමනාව සමෘද්ධි බැංකුවේ ආරම්භ කරන ඉතිරි කිරීමේ ගිණුමක් හරහා අදාළ ප්‍රතිලාභීන්ට ලබා දෙන බවද සඳහන් කර ඇත.

02. එම උපදෙස් අනුව, ප්‍රතිලාභ මුදල් ගෙවීම් සඳහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය භාර නිලධාරී විසින් සහතික කර දෙන ලේඛණ වල නම සඳහන් ප්‍රතිලාභීන් නමින්ම සමෘද්ධි බැංකුවේ දිරිය මාතා හෝ සාමාජික නොවන ඉතුරුම් ගිණුම් අතරින්, එක් ගිණුමක් ආරම්භ කරන ලෙස කාරුණිකව දන්වමි. නව ගිණුම් ආරම්භ කිරීමේදී මෘදුකාංගයේ සහ manual සිදු කිරීමේදී ලබා දී ඇති උපදෙස් අනුගමනය කළ යුතුය.

03. දැනටමත්, සාමාජික/ දිරියමාතා/ සාමාජික නොවන ගිණුමක් ආරම්භ කර පවත්වා ගෙන යන ප්‍රතිලාභීන්ට නව ගිණුමක් විවෘත කිරීම අවශ්‍ය නොවේ.

04. මෙම වැඩසටහන යටතේ, ප්‍රතිලාභීන්ට ගෙවීම් කිරීමට අවශ්‍ය අරමුදල් සහ ගිණුම් සටහන් පිළිබඳ උපදෙස් ඉදිරියේදී ඔබ වෙත දැනුම් දෙන බවද තවදුරටත් දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
7. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස හා අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |